# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2482/11 – 2026 අප්‍රේල් මස 02 වැනි බ්‍රහස්පතින්දා – 2026.04.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2022/121.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.10.04 දිනැති හා අංක 2456/82 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.09.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පන්නිපිටිය, මාකුඹුර, මායා මාවත, 360/12 හි පදිංචි එච්. ඩබ්. එම්. බී. එස්. පී. රාහුබද්ධ මිය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 34 හි පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A70/2025 හා 2026.02.09 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 මාර්තු මස 13 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී**

ගොනු අංකය - IR/COM/01/2022/121
නඩු අංකය - A/70/2025

*පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම.*

නීතිඥ ආනන්ද ලාල් නානායක්කාර මහතා
නීතිඥ තිලිනි හැගොඩ මෙනෙවිය

*පළමු පාර්ශ්වය*

එච්. ඩබ්. එම්. බී. එස්. පී. රාහුබද්ධ මිය
අංක 360/12,
මායා මාවත,
මාකුඹුර, පන්නිපිටිය.

සහ

*දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම.*

නීතිඥ ඩී. ආර්. ඒ. එන්. චතුරංගී මිය
(කළමනාකරණ නීති)
නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ
නෙත්මි මලවිආරච්චි මෙනවිය
ලලිත් එදිරිසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(මානව සම්පත් කළමනාකරු හා පාලන)
වසන්තා ජයවර්ධන මිය
සහකාර සාමාන්‍යාධිකාරි
(මානව සම්පත් සංවර්ධන හා පාලන)
කළමනාකරණ සහකාර
නවෝද්‍යා යසන්ති මිය

*දෙවන පාර්ශ්වය*

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
අංක 34,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
කොළඹ 02.

දෙපාර්ශ්වය අතර පවතින කාර්මික ආරාවුල

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය ගරු ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල අනුව එම ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2025 සැප්තැම්බර් මස 26 හා අංක IR/COM/01/2022/121 ලිපියෙන් ඒ. බී. හේරත් වන මා බේරුම්කරු වශයෙන් පත්කොට මා වෙත යොමු කර ඇත.

**ආරාවුලට තුඩුදුන් කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව දෙපාර්ශ්වය අතර උද්ගතවී ඇති පහත සඳහන් කාර්මික ආරාවුලයි.

මෙම ආරාවුලට හේතු වී ඇති කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද මහත්මිය විසින් නිකුත්කරන ලද 2025.09.17 වන දින ඇයගේ අංක IR/COM/01/2022/121 ලිපියෙන් "ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාස්තු විද්‍යාඥ ලෙස සේවය කළ එච්. ඩබ්. එම්. බී. එස්. පී. රාහුබද්ධ මිය වෙත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/2013 හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 4/2018 (1) ප්‍රකාරව ක්ෂේත්‍ර දීමනාව හා වෘත්තීය දීමනා අදාළ චක්‍රලේඛ ක්‍රියාත්මක වූ දින සිට ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබියදීත් නොගෙවීම නිසා අසාධාරණයක් සිදුවී තිබේද? එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඇයට හිමි විය යුතු සහන කවරේද යන්න" පිළිබඳව වේ.

පහත සඳහන් දිනයන් යටතේ නඩු අංක A/70/2025 යටතේ කාර්මික අධිකරණයට දෙපාර්ශ්වයම කැඳවා විභාග පවත්වා ඇත.

| | |
|---|---|
| 2025.10.15 | 2025.12.18 |
| 2025.10.22 | 2025.12.23 |
| 2025.10.28 | 2025.12.30 |
| 2025.11.04 | 2026.01.07 |
| 2025.11.13 | 2026.01.27 ලිඛිත දේශන |
| 2025.11.20 | |
| 2025.11.27 | |
| 2025.12.02 | |
| 2025.12.10 | |

**බේරුම්කරණ විභාගයේ පසුබිම හා එය පැවැත්වූ ආකාරය**

මෙම නඩුව A/70/2025 යටතේ 2025.10.15 සිට 2026.01.27 දක්වා කාර්මික අධිකරණයේ පැවැත්වීමට කටයුතු කර ඇත. මෙම බේරුම්කරණයට අදාළව කාර්මික අධිකරණය ඉදිරියේ දෙපාර්ශ්වයම ලබා දුන් සාක්ෂි හා විභාගය අවසන් වීමෙන් පසු ලබා දුන් ලිඛිත දේශන මෙන්ම අදාළ සලකුණු කරන ලද ලේඛන ද විවිධ තොරතුරු අඩංගු ලේඛන මාගේ විශේෂ අවධානයට යොමු විය. තවද දෙවන පාර්ශ්වය ඉල්ලුම්කාරිය තම තනතුරෙන් ඉල්ලා අස්වීමෙන් පසු මෙවැනි ඉල්ලීමක් කිරීමට දෙපාර්ශ්වය අතර සේවා ගිවිසුමක් නැතැයි නැගූ තර්කය ද පදනම් විරහිත බැවින් එම මතය ද මා විසින් බැහැර කරන ලදී.

මෙම බේරුම්කරණයේ ඉල්ලුම්කාරිය වන එච්. ඩබ්. එම්. බී. එස්. පී. රාහුබද්ධ මහත්මිය 1999.02.01 වන දින V වන ශ්‍රේණියේ ගෘහ නිර්මාණ ශිල්පිණියෙකු ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරියට බඳවාගෙන ඇත. (R2) එමෙන්ම ඇය අංක 1061/6 හා 1999.01.05 හි අනු අංක 166 යටතේ වරලත් වාස්තු විද්‍යාඥවරියක් වශයෙන් ශ්‍රී ලංකා වාස්තුකරුවන්ගේ ආයතනය විසින් ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇත. (පැ. 24, පැ. 24 (ආ)) ඇය 2000.09.15 වන දින මේ අනුව iv වන ශ්‍රේණියට උසස් කර ඇති අතර 2012.01.24 ජ්‍යෙෂ්ඨ ගෘහ නිර්මාණ ශිල්පී හා ව්‍යාපෘති සැලසුම් iii වන ශ්‍රේණියට උසස් කර ඇත. ඉල්ලුම්කාරිය 2022.12.31 වන දින සේවයෙන් ඉල්ලා අස්වී ඇත. මේ අනුව ඇයගේ සේවා කාලය වසර 23 ක් වේ. මෙම කාර්මික ආරාවුලට හේතු වී ඇත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/2013 හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2018 (01) ප්‍රකාරව ඇයට හිමි ක්ෂේත්‍ර දීමනාව හා වෘත්තීය දීමනාව අදාළ චක්‍රලේඛ ක්‍රියාත්මක වූ දින සිට ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබියදී ඇයට එම දීමනා නොගෙවීමයි.

මේ සම්බන්ධයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, නීතිඥ මනෝරි ටී. ඔලබොඩුව මහත්මියගේ 2022.12.13 ලිපියෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අංක 16/2022, 2022.11.16 මණ්ඩල පත්‍රිකා අංක 10686 (16/2022) අනුව "ඉහත මණ්ඩල පත්‍රිකාව සළකා බැලූ අධ්‍යක්ෂ මණ්ඩලය 2015 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ක්‍රියාත්මක වන දිනයේ සිට (2013.04.01) වාස්තුවිද්‍යාඥ සේවයේ නිලධාරීන්ට ක්ෂේත්‍ර දීමනා ගෙවීමට අනුමත කරන ලදී. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 4/2018 (1) ප්‍රකාරව ශ්‍රී ලංකා වාස්තුවිද්‍යාඥ නිලධාරීන්හට වරලත් වෘත්තීය දීමනාව එම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනයේ සිට ගෙවීම අනුමත කරන ලදී යනුවෙනි." (පිටු අංක 70 - ඇමුණුම් 6)

එහෙත් අදාළ ගෙවීම් ඉල්ලුම්කාරියට ගෙවීමට කටයුතු නොකළ බැවින් ඇයගේ පැමිණිල්ලක් පිළිබඳව නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (කාර්මික සබඳතා) අමතන ලද ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිගේ අංක 3/2/3/3/1 - 482 හා 2022.11.23 ලිපියේ 10 වන ඡේදයේ "එම 23/2013 හා 04/2018 (1) හා චක්‍රලේඛ ප්‍රකාරව එම දීමනා චක්‍රලේඛය ක්‍රියාත්මක වූ දින සිට හිඟ දීමනා සහිතව ගෙවීම් කරන ලෙසය. ඒ අනුව ඉදිරි කටයුතු මේ වන විට සිදුවෙමින් පවතින බව කාරුණිකව වාර්තා කරමි." යනුවෙන් ලිපියක් යවා ඇත.

මේ අනුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල් වෙත) අංක 03/02/03/03/01/482 හා 2022.11.23 ලිපියෙන් අදාළ ගෙවීම් කටයුතු කිරීමට වැඩ බලන සාමාන්‍යාධිකාරී දැනුම් දී ඇත.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී ඔහුගේ 2022.11.28 ලිපියෙන් ඉල්ලුම්කාරිය හා තවත් අයවලුන්හට 10686 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් චක්‍රලේඛය ක්‍රියාත්මක වන දින සිට දීමනා ගැළපීම් කර ගෙවීම් කිරීමට කටයුතු කරන බව දැනුම් දී ඇත. මේ පිළිබඳව ඉල්ලුම්කාරිය 2020.09.28 කම්කරු දෙපාර්තමේන්තුවට කරන ලද ලැමිණිල්ලකට අනුව 2021.11.23 හා අංක CS/CO/CVD/10/311/20 ලිපියෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී වෙත දන්වා ඇති පැමිණිලිකාරියගේ පළමු ඉල්ලීම මත අයවැය ලබා දුන් ක්ෂේත්‍ර දීමනා හිඟ මුදල් කඩිනමින් ලබා දීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි යනුවෙනි. “පැමිණිලිකාරියගේ දෙවන ඉල්ලීම වන වරලත් වාස්තු විද්‍යා ඉංජිනේරුවරුන් සඳහා ලබා දුන් වෘත්තීය දීමනාව ඇය වෙත ලබා දීමට කටයුතු කරන මෙන් මෙයින් දන්වා සිටිමි.” යනුවෙනි.

එමෙන්ම දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස්වරයා විසින් ඉහත අංක 03 හා 04 පරිදි කටයුතු කර මෙම ලිපියේ දින සිට මසක් ඇතුළත වාර්තා කරන ලෙසට ද දෙවන පාර්ශ්වයට දැනුම් දී ඇත. එසේ කටයුතු නොකරන්නේ නම් නැවත දැනුම් දීමකින් තොරව පැමිණිල්ලේ ඉල්ලීම් දෙකට සාධාරණයක් ඉටු කර දීම සඳහා ඉදිරි පියවර ගන්නා බවද සඳහන් කර ඇත. (පැ. 17, පැ. 17(අ) පිටු අංක 170)

මෙම ලිපියට පිළිතුරු යවමින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා කම්කරු දෙපාර්තමේන්තුවට දන්වා ඇත්තේ “10686 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා ලද තීරණය වූයේ මෙම 23/2013 හා 04/2018(1) චක්‍රලේඛ ප්‍රකාරව එම දීමනා චක්‍රලේඛය ක්‍රියාත්මක වූ දින සිට හිඟ දීමනා සහිතව ගෙවීම් කරන ලෙසය. මේ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව වාර්තා කරමි” යනුවෙනි. (පැ. 18 (ඇ)

2025.11.04 වන දින කාර්මික අධිකරණයේ දී පැ. 18(ඇ) අනුව ඉල්ලුම්කාරිය තම නීතිඥවරයාගේ මෙහෙයවීම යටතේ සාක්ෂි ලබාදෙමින් පහත පිළිතුරු සපයා ඇත.

ප්‍ර. එනමුත් එම ගෙවීම් තමාට ලැබුණාද?
පි. නැහැ.

දෙපාර්ශ්වයම විසින් ඉදිරිපත් කරන ලද පළමු විස්තර ප්‍රකාශයේ සිට කාර්මික අධිකරණයේ විවිධ අවස්ථාවලදී පත් කරන ලද තර්ක හා හරස් ප්‍රශ්න මෙන්ම අවසාන ලිඛිත දේශනයෙන් ඉදිරිපත් කර තිබූ සියලු කරුණු පිළිබඳ මාගේ අවධානය යොමු විය.

**නිගමන හා නිර්දේශ**

මේ අනුව දෙවන පාර්ශ්වය විසින් අවසාන ලිඛිත දේශනයෙන් අංක 01 සිට 14 දක්වා සියලු කාරණාවන් පිළිගෙන ඇති බව නිරීක්ෂණය විය. එමෙන්ම සිය ස්ථාවරය ප්‍රකාශ කිරීමේ දී R07 (1) පිළිබඳව අවධානය යොමු කළ අතර එහි R07 (1)(a) යනුවෙන් ලකුණු කරන ලද ඡේදය විශේෂ අත්තිකාරම් 2025 වර්ෂයට අදාළව නිකුත් කරන ලද්දක් බවට නිගමනය කරමි. එය වසරක් තුළ අය කර ගැනීමට ලබාදෙන විශේෂ අත්තිකාරම් මුදලක් වේ. එය මෙම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/2013 හා 04/2018(1) ට අදාළ නොවන බවට නිශ්චය කර නිගමනය කරමි. එය අධිකරණය සම්පූර්ණයෙන් නොමඟ යැවීමට කරන ලද උත්සාහයක් බව පෙනී යයි. එමෙන්ම R07 (ii)a වශයෙන් ලකුණු කරන ලද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක PE/COP/POLI/GEN/MIS/2017 - 0 හා 2018.05.30 දරන ලිපිය මෙම වාස්තු විද්‍යාඥයන්ගේ ක්ෂේත්‍ර දීමනාවට හෝ වෘත්තීය දීමනාවට අදාළ නොවන අතර එය අදාළ වන්නේ හදිසි අනතුරු නිවාඩු හා වන්දි ලබා ගැනීම සඳහා පමණි. එම ලිපිය දෙවන පාර්ශ්වය විසින් සලකුණු කර ඉදිරිපත් කර ඇතත් එය අදාළ නොවන බැවින් එම ලිපිය ප්‍රතික්ෂේප කරමි.

එමෙන්ම 2017.08.23 හා අංක අමප/17/1319/736/023 අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීම යටතේ දෙවන පාර්ශ්වයේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් වෙත 2017.08.15 අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම්දීමට අදාළව (01 යටතේ පැහැදිළි දක්වා ඇත්තේ ඉහත අමාත්‍ය මණ්ඩල සන්දේශයේ අවසාන ඡේදයේ i යෝජනාවේ දැක්වෙන වෘත්තිකයන්ටත් අදාළ කර ගත හැකි බැවින් එකී යෝජනා සම්බන්ධයෙන් ඉදිරි කටයුතු නොකිරීම” බවයි.) (R10 (ii))

23/2013 හා 04/2018(1) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මේ අනුව අදාළ කරගත හැකි බවටත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයත් නැවත අවශ්‍ය නොවන බව තහවුරු කර ඇත.

එමෙන්ම ග්‍රාමීය නිවාස හා ගොඩනැගිලි ද්‍රව්‍ය, කර්මාන්ත, ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අංක 2/1/171//ii(A) හා 2022.01.06 ලිපියෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරි අමතමින් එම ලිපියේ පිටපතක් අධිකාරියේ සභාපති වෙත ද යවමින් වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන්ට අදාළ දීමනා ලබා දීමට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිපාලන 04/2018 හා 28/2011 ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ එම චක්‍රලේඛ කොන්දේසි සම්පූර්ණ කරන ලද ඉංජිනේරු වෘත්තිකයන් හට වරලත් ඉංජිනේරු දීමනාව හා ක්ෂේත්‍ර දීමනාව ලබා දීමට කටයුතු කර ඇති බැවින් එපරිද්දෙන්ම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 4/2018 (1) පාදක කර ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ගෙන චක්‍රලේඛ කොන්දේසි සම්පූර්ණ කර වාස්තු විද්‍යාඥ වෘත්තිකයන්ට ද වරලත් වෘත්තීය දීමනාව ගෙවීමට කටයුතු කරන ලෙසද කාරුණිකව දන්වමි.” යනුවෙන් දැනුම් දී ඇත. (පිටු අංක 382)

දෙවන පාර්ශ්වය විසින් සලකුණු කරන ලද R12(ii) හා එම ලිපියේ R12(ii)a වශයෙන් සලකුණු කරන ලද කොටස සම්බන්ධයෙන් 2025.12.18 වන දින දෙවන පාර්ශ්වයෙන් ප්‍රශ්න කළ විට පහත සඳහන් පිළිතුරු ලබා දී ඇත.

ප්‍ර. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියේ 3 පරිදි ඉඩ සළසා දී නැති බව දැනුම් දීලා තියෙන්නේ 2023.02.24 නේද?

පි. ඔව්

ප්‍ර. මෙය ක්‍රියාත්මක වන්නේ 2023.02.24 සිට ඉදිරියට නේද?

පි. ඔව්. (පිටු අංකය 280 - 281)

ඉල්ලුම්කාරිය සේවයෙන් ඉවත් වී ඇත්තේ 2022.12.31 වන දින වන අතර මෙම ලකුණු කරන ලද ලිපියේ කරුණු අදාළවීමක් නොවන බවට නිගමනය කරමි. එමෙන්ම මෙතෙක් ඉහත දීමනාව ගෙවන ලද වරලත් ඉංජිනේරුවරුන්ගෙන් ද එම මුදල් නැවත අය කිරීමට කටයුතු කර නොමැති බවද පෙනී යයි.

නාගරික සංවර්ධන හා නිවාස ඉදිකිරීම් අමාත්‍යවරයා අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලදී එය නියෝජනය කරන අතර ඔහු ද සාමූහිකව එම තීරණවලට අනුමැතිය ලබාදීම සම්ප්‍රදායානුකූලව සිදු වේ එම තීරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ලබා දී තිබියදී නැවත අමාත්‍යාංශයට යොමු කිරීමටත් විවිධ ආයතන විමසීමට දෙවන පාර්ශ්වය වරලත් වාස්තු විද්‍යාඥවරියන් සම්බන්ධයෙන් කටයුතු කර ඇති බව පෙනී යයි. එහෙත් වරලත් ඉංජිනේරුවරු සම්බන්ධයෙන් එසේ කටයුතු කර ඇති බවත් නොපෙනේ. ඉල්ලුම්කාරියට අදාළ ක්ෂේත්‍ර දීමනා හා වෘත්තීය දීමනා ගෙවීම ප්‍රමාදවීමට මෙය ද බලපා ඇත.

මේ අනුව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කළ ඉල්ලුම්කාරියගේ ක්ෂේත්‍ර දීමනාව හා වෘත්තීය දීමනා නොගෙවීම තුළින් ඇයට බලවත් අසාධාරණයක් සිදුවී ඇති බවට නිශ්චය කොට නිගමනය කරමි. එබැවින් එම මුදල ඇය ගණන් බලා ඇති ආකාරය කාර්මික අධිකරණයේ 2025.11.04 වන දින ලකුණු කරන ලද පැ. 25 අනුව පහත සටහන තුළ දක්වා ඇත. මෙම මුදල සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය කාර්මික අධිකරණයේ කිසිදු හබ කිරීමක් සිදු කර නැත.

**වරලත් වාස්තු විද්‍යාඥයන්ට ලැබිය යුතු වෘත්තීය දීමනාව හා ක්ෂේත්‍ර දීමනාව ගණනය කිරීම**

1. **වරලත් වාස්තු විද්‍යාඥයන්ට ලැබිය යුතු වෘත්තීය දීමනාව**

| | |
|---|---|
| චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනය | 2018.02.01 |
| මා වරලත් වා. විද්‍යා. ලෙස සේවයට බැඳුණු දිනය | 1999.02.01 |
| 2018.02.01 දක්වා සේවය කළ අවුරුදු ගණන | 19 |
| සේවය අවසන් කළ දිනය | 2022.12.31 |

| කාලය | සේවා කාලය | මාස ගණන | මාසික දීමනාව | මුළු මුදල |
|---|---|---|---|---|
| 2018.02.01 - 2019.01.31 | 19 | 12 | 20,000.00 | 240,000.00 |
| 2019.02.01 - 2020.01.31 | 20 | 12 | 20,000.00 | 240,000.00 |
| 2020.02.01 - 2021.01.31 | 21 | 12 | 25,000.00 | 300,000.00 |
| 2021.02.01 - 2022.01.31 | 22 | 12 | 25,000.00 | 300,000.00 |
| 2022.02.01 - 2022.12.31 | 23 | 11 | 25,000.00 | 275,000.00 |
| **ලැබිය යුතු මුළු මුදල** | | | | **1,355,000.00** |

2. **වරලත් වාස්තු විද්‍යාඥයන්ට ලැබිය යුතු ක්ෂේත්‍ර දීමනාව**

චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනය 2013.04.01
ක්ෂේත්‍ර දීමනාව ගෙවීමට පටන් ගත් දිනය 2015 පෙබරවාරි මස

| කාලය | මාස ගණන | මාසික දීමනා | මුළු මුදල |
|---|---|---|---|
| 2013.04.01 - 2015.01.31 | 22 | 15,000.00 | 330,000.00 |

**ලැබිය යුතු සම්පූර්ණ මුදල** **1,685,000.00**

ඉහත දක්වා ඇති ඉල්ලුම්කාරියට ගෙවිය යුතු වෘත්තීය දීමනාව හා හිඟ ක්ෂේත්‍ර මුදල වශයෙන් රුපියල් දහසය ලක්ෂ අසූ පන්දහසක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉල්ලුම්කාරිය වන එච්. ඩබ්. එම්. බී. එස්. පී. රාහුබද්ධ මියට ගෙවිය යුතු බවට නිගමනය කොට නිශ්චය කරමි. මෙම මුදල ඇයට ලැබීමට නියමිතව තිබුණේ 2022.12.31 පෙර වන අතර ඒ සඳහා අවශ්‍ය සියලුම අනුමැතීන් ලැබී තිබූ බව සනාථ විය. තවද 23/2013 හා 4/2018 (1) අමාත්‍ය මණ්ඩල තීරණ නිකුත් කර තිබුණේ භාණ්ඩාගාරික අනුමැතිය ඇතිව බව ද එම චක්‍රලේඛනවල පැහැදිලිව සඳහන් කර ඇත.

මේ අනුව ඇයට අදාළ ගෙවීම් සිදුකරලීම අනවශ්‍ය ප්‍රමාදයකට ලක් කර ඇති බවට නිශ්චය කර නිගමනය කර ඉල්ලුම්කාරිය බලවත් අසාධාරණයක් සිදුවී ඇති බැවින් ඇයට සාධාරණයක් වීම සඳහා ගෙවිය යුතු හිඟ මුදලක් වශයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් රුපියල් දහසය ලක්ෂ අසූ පන් දහසක (රු. 1,685,000.00) මුදලක් ඉල්ලුම්කාරියට ගෙවිය යුතු බවට නිගමනය කර නියම කරමි.

## ප්‍රදානය

සැමවිටම සාධාරණ හා යුක්ති සහගත තීරණයක් ලබාදීමට බැඳී සිටින කාර්මික අධිකරණය හා බේරුම්කරණය ඉල්ලුම්කාරිය වන එච්. ඩබ්. එම්. බී. එස්. පී. රාහුබද්ධ මහත්මියට අසාධාරණයක් සිදු වී ඇති බැවින් සාධාරණයක් ඉටු විය යුතු බවට තීරණය කරමි. ඒ අනුව මෙම ප්‍රදානයේ ඇතුලත් එම මහත්මියට ගෙවිය යුතු හිඟ ක්ෂේත්‍ර දීමනා වශයෙන් රුපියල් තුන් ලක්ෂ තිස් දහසක් ද (රු. 330,000.00) හිඟ වෘත්තීය දීමනා වශයෙන් රුපියල් දහතුන් ලක්ෂ පනස් පන් දහසක් ද (රු. 1,355,000.00) ඉල්ලුම්කාරියට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ගෙවිය යුතු වේ.

මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී මසක් ඇතුළත ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා විසින් එම ප්‍රදානය ක්‍රියාත්මක කර එසේ ක්‍රියාත්මක කළ බව දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත ලිඛිතව දැනුම් දිය යුතු බවට ද නියෝග කර නියම කරමි.

**ඒ. බී. හේරත්,**
**බේරුම්කරු.**

2026 ක් වූ පෙබරවාරි මස 09 වන දින,
බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

EOG 04 – 0003

මගේ අංකය: IR/10/86/2013.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.07.08 දිනැති හා අංක 2444/20 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.07.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කැළණිය, හිඹුටුවැල්ගොඩ, සුදර්ශන මාවත, අංක 735 හි පදිංචි ඒ. ඩී. ජයසිංහ මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 15, රොක්හවුස් පටුමග, අංක 15 හි පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A40/2025 හා 2026.01.30 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 මාර්තු මස 13 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය**

නඩු අංකය - A/40/2025
යොමු අංකය - IR/10/86/2013

ඒ. ඩී. ජයසිංහ මහතා,
අංක 735,
සුදර්ශන මාවත,
හිඹුටුවැල්ගොඩ,
කැළණිය.

*පළමු පාර්ශ්වය*

සහ

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංක 15,
රොක්හවුස් පටුමග,
කොළඹ 15.

*දෙවන පාර්ශ්වය*

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පිළියන්දල, බුද්ධාලෝක මාවතේ, අංක 40 හි ආචාර්ය කේ. ඒ. තිලකරත්න වන මා පත්කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ.

"ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සැපයුම් නිලධාරියෙකු ලෙස සේවය කළ ඒ. ඩී. ජයසිංහ මහතා හට 2005.04.01 දින සිට ලබාදීමට නියමිතව තිබූ වැටුප් වර්ධක 04 ක් හා ඊට අදාළ හිඟ මුදල් ලබා නොදීම සහ ජ්‍යෙෂ්ඨ සැපයුම් නිලධාරී හා සැපයුම් කළමනාකරු යන තනතුරුවලට අදාළ උසස්වීම් ලබා නොදීම යුක්ති සහගතද? එසේ නොවන්නේ නම්, ඒ. ඩී. ජයසිංහ මහතාට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ."

මෙම කාර්මික ආරාවුල පූර්ව බේරුම්කරු විසින් 2019.02.07, 2019.03.18, 2019.04.30, 2019.05.20, 2019.06.03, 2019.07.29, 2019.10.01 යන දිනවල පරීක්ෂණයට භාජනය කොට තිබූ අතර, 2019.10.01 දින නඩුකරය බහා තබා ඇත.

පැමිණිලිකරු හා විත්තිකාර ආයතනය අතර කම්කරු විනිශ්චයාධිකාර නඩු අංක 02/අති/3684/2014 දරන නඩුවේ නියෝගයක් ද නිකුත් වී තිබුණි.

එමෙන්ම 1990 අංක 32 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 31 D (4) වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබූ අභියාචනයට අනුව මහාධිකරණ නඩු අංක HC LTA 14/23 අනුව බස්නාහිර පළාත්බද මහාධිකරණ නඩු තීන්දුව ද ප්‍රකාශයට පත් වී ඇත. ඉන් අනතුරුව යළිත් SC, HC, LA, No. 55 / 2024 ගරු ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු ප්‍රකාශයක් නිකුත්කොට තිබේ.

ඉහත නඩුකරයන් අවසාන වී ඇති බැවින්, 2019.10.01 දින ගරු බේරුම්කරණ අධිකරණය විසින් බහා තබන ලද මෙම නඩුකරය යළි පරීක්ෂණයට භාජනයකොට තිබේ. කෙසේ වෙතත් එම අවස්ථාවේදී බලයලත් බේරුම්රු මෙම නඩු කටයුත්තෙන් ඉල්ලා අස්වී ඇති බැවින්, නව බේරුම්කරු විසින් මෙම නඩුකරය 2025.07.21, 2025.08.11, 2025.09.30, 2025.10.21, 2025.11.17, 2025.12.12 දිනවලදී විභාගයට ගනු ලැබූ අතර, තවදුරටත් සාක්ෂි විමසමින් නඩුකරය අවසන් කරන ලදී.

**පළමු පාර්ශ්වය හෙවත් පැමිණිලිකරු බේරුම්කරණ අධිකරණය වෙත තම ඉල්ලීම ඉටුකර ගැනීම යුක්ති සහගත කිරීම සඳහා පහත සඳහන් කරුණු ගොනු කොට තිබේ.**

පාර්ශ්වයන් අතර අදාළ ආරාවුල වශයෙන් සඳහන් වන්නේ "ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සැපයුම් නිලධාරියකු ලෙස සේවය කළ ඒ. ඩී. ජයසිංහ මහතාහට 2005.04.01 දින සිට ලබාදීමට නියමිතව තිබූ වැටුප් වර්ධක 04 ක් හා ඊට අදාළ හිඟ මුදල් ලබා නොදීම සහ ජ්‍යෙෂ්ඨ සැපයුම් නිලධාරි හා සැපයුම් කළමනාකරු යන තනතුරුවලට අදාළ උසස්වීම් ලබා නොදීම යුක්ති සහගතද? එසේ නොවන්නේ නම් ඒ. ඩී. ජයසිංහ මහතාට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

ඉහත කී යොමුව අනුව,

1. 2005.04.01 දින සිට ලබාදීමට නියමිතව තිබූ වැටුප් වර්ධක 04 ක් හා ඊට අදාළ හිඟ මුදල් ලබා නොදීම.
2. ජ්‍යෙෂ්ඨ සැපයුම් නිලධාරි හා සැපයුම් කළමනාකරු යන තනතුරුවලට අදාළ උසස්වීම් ලබා නොදීම.

යන ප්‍රධාන කරුණු 02 මෙම නඩුවේදී සළකා බැලිය යුතු මූලිකම කරුණු වේ.

ඉල්ලුම්කරු ප්‍රසම්පාදන හා සැපයුම් අංශයට අදාළව තමාගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳව තම මූලික සාක්ෂියේදී කරුණු ඉදිරිපත් කරන ලදී. ඒ අනුව A7 දරන ලේඛනය මගින් Sripatum University හි ප්‍රසම්පාදන හා ගිවිසුම් පරිපාලනය සම්බන්ධයෙන් සහතිකයක් ඉදිරිපත් කරන ලද අතර, එසේම A 6 දරන ලේඛනය මගින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ද ප්‍රසම්පාදන හා ගිවිසුම් පරිපාලන සම්බන්ධව නිකුත් කරන ලද සහතික පත්‍රයක්ද ලකුණු කරන ලදී. එසේම A3a, A3b සහ A3c මගින් ද, තමා සේවය කරන ලද ITOCHU CORPORATION සමාගම විසින් නිකුත් කරන ලද සහකාර මිලදී ගැනීමේ නිලධාරි තනතුර සඳහා අදාළ හැඳුනුම්පත් ද ලකුණු කරන ලදී. ඊට අමතරව දෙවන පාර්ශ්වය තම ලිඛිත දේශන සමඟ ලකුණු කරන ලද R1 ලේඛනය අනුව ද පළමු පාර්ශ්වය සහකාර මිලදී ගැනීම් නිලධාරියකු ලෙස එම සමාගමේ සේවය කළ බව තහවුරුකොට ඇත.

එසේම ඉල්ලුම්කරු තම මූලික සාක්ෂියේදී ප්‍රකාශකොට ඇත්තේ,

ප්‍ර : තමන්ට මේ තනතුර ලබාගැනීමට තිබුණු අධ්‍යාපන සුදුසුකම මොනවාද?
උ : O/L තිබුණා. ඊට පසුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වසර 12 ක සප්ලයි ස්පේශලිස්ට් I සහතිකය
ප්‍ර : ගුවන් හමුදාවේ තමුන්ට කොපමණ කාලයක සේවා පළපුරුද්දක් තියෙනවාද?
උ : වසර 12
ප්‍ර : ඒ සම්බන්ධයෙන් තමුන්ට සහතිකයක් තිබෙනවාද?
උ : තියෙනවා
(මෙම සහතිකය A5 වශයෙන් ලකුණුකොට ඇත.)

ඉහත ඉදිරිපත් කරන ලද සියළු සුදුසුකම් අනුව පළමු පාර්ශ්වයට සැපැයුම් කළමනාකාර තනතුරක් දැරීමට සුදුසු ප්‍රමාණවත් අධ්‍යාපනික හා සේවා පළපුරුද්දක් පැවැති බව පැහැදිලි වේ.

ඉල්ලුම්කරු තවදුරටත් මූලික සාක්ෂි ලබාදෙමින් ප්‍රකාශ කරන ලද්දේ සංස්ථාවේ වසර 05 ක් සම්පූර්ණ වූ (ස්ථිර) සේවකයින් ශ්‍රේණිගත කිරීම සඳහා අභ්‍යන්තර අයදුම්පත් කැඳවන අවස්ථාවේ සහකාර සැපැයුම් කළමනාකාර තනතුරට තමාට අදාළ සුදුසුකම් තිබුණු බවත්, ඒ අනුව තමාව 2012.07.12 දින සම්මුඛ පරීක්ෂණයකට කැඳවන ලද බවත් එහෙත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වූයේ නැති බවත්, අවලංගු කරන බව තමාට දැනුම් නොදුන් බවත් ප්‍රකාශ කරන ලදී. ඉල්ලුම්කරු තවදුරටත් තම මූලික සාක්ෂියේදී මෙසේ ප්‍රකාශකොට ඇත.

ප්‍ර : තමන්ට සහකාර සැපැයුම් කළමනාකාර තනතුරවත් හම්බවෙන්නේ නැතුව තමන් කොහොමද සැපැයුම් කළමනාකාර තනතුර ඉල්ලන්නේ?

උ : ස්වාමීණි, මම මුලින් මාස 02 අපේ Supply Manager තිලකරත්න මහත්මයා ගියාට පස්සේ Acting Supply Manager කළා මාස 02 ක්. ඒ අවස්ථාවේදී Transport Controller හිටපු ලකී ප්‍රනාන්දු මහත්මයා, එයා කොන්ත්‍රාත් පදනම මත හිටපු මහත්මයෙක්. ඒ මහත්මයාට අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කිසිම දෙයක් නැතුව ඒ මහත්තයා මම හිටපු Acting Supply Manager තනතුරට පත් කළා.

ප්‍ර : තමන් කොහොමද කියන්නේ ලකී ප්‍රනාන්දුට ඒ සුදුසුකම් නෑ කියලා?

උ : ඒ මහත්තයා Transport Controller විදිහට බඳවාගෙන තිබුණේ.

ප්‍ර : සුදුසුකම් නෑ කියලා කියන්න විදිහක් නෑනේ. ඒ සුදුසුකම් Check කරාද?

උ : එතුමා අපේ අංශයට ආවාට පසුව විභාග ඉල්ලන්න ආවා. එතුමා ඒ වෙලාවේ මගෙන්ම අහලා දාන්න ඕනේ කොහොමද කියලා මම ඒ අවස්ථාවේදී කිව්වා. මම එතකොට එතුමාගෙන් ඇහුවා මොනවද මේ සම්බන්ධයෙන් තිබෙන්නේ කියලා. එයා කිව්වේ එයාට Transport සම්බන්ධයෙන් තමයි දැනුම තිබෙන්නේ ඉන් එහාට දෙයක් නෑ කියලා. ඊට පසුව ස්වාමීණි ලකී ප්‍රනාන්දු මහත්මයා ආවාට පස්සේ ඒ මහත්මයාගේ වයස පිරීම උඩ විශ්‍රාම ගියා. ඊට පස්සේ ස්වාමීණි විධිමත් විධිහට Supply Manager කෙනෙක් ගන්න කියලා තමයි පත්තරේ දැම්මේ. ඊට පස්සේ ස්වාමීනි පත්තරේ දැම්මම මමත් ඉල්ලුම් කරපු ඉල්ලුම්කරුවෙක්. නමුත් කොහොම හරි කීර්ති ජී. වතුගේ කියලා මහත්මයෙක් තමයි ඒ වෙලාවේ තෝරාගෙන තිබුණේ සම්මුඛ පරීක්ෂණයෙන් සැපැයුම් කළමනාකරු තනතුරට. ඊට පසුව ස්වාමීනි කීර්ති ජී. වතුගේ කියන මහත්තයට මූලික සුදුසුකම්වත් නෑ කියලා HRM ලා සහ යුනියන් වලින් ප්‍රශ්න ආව නිසා කීර්ති ජී. වතුගේ කියන මහත්මයා බඳවා ගත්තේ නෑ. නමුත් ලිපියක් නිකුත් කර තිබුණා සේවයට එන්න කියලා. නමුත් ඒ මහත්මයා ආවේ නෑ. ඒ සැරේ ස්වාමීනි රොද්‍රගෝ කියලා මහත්මයෙක් බඳවා ගත්තා එම තනතුරටම. ඊට පසුව එම මහත්මයාත් මූල්‍ය අක්‍රමිකතාවයක් උඩ ඒ මහත්තයා සංස්ථාවෙන් ඉවත් වුණා. නැවත සැරයක් ඒ මහත්මයා මොකක් හරි කරලා වෙන අංශයකට ආවා.

ප්‍ර : පත්තරේ දැන්වීම අනුව තමුන්ට එම තනතුරට ඉල්ලුම් කරන්න සුදුසුකම් තිබුණාද?

උ : එහෙමයි ස්වාමීණි.

ප්‍ර : ඒ සඳහා සම්මුඛ පරීක්ෂණයක් තිබුණාද?

උ : තිබුණා ස්වාමීණි.

ප්‍ර : ඒ සම්මුඛ පරීක්ෂණයෙන් තමන්ට ලැබුණු ප්‍රතිඵලය මොකක්ද?

උ : මාව ගත්තේ නෑ.

ප්‍ර : ඒ කියන්නේ එම සම්මුඛ පරීක්ෂණයෙන් තමන් ඉවත් කරලා?

උ : එහෙමයි.

ප්‍ර : තමුන් මොනවාද ගරු අධිකරණයෙන් ඉල්ලන සහනයන්?

උ : මම ඉල්ලා සිටින්නේ 2005.04.01 දින සිට ජ්‍යෙෂ්ඨ සැපැයුම් නිලධාරී තනතුර (Grade 01) හා හිඟ වැටුප් ලබා දෙන්න කියලා. ඊට අමතරව සභාපතිතුමා නිකුත් කර තිබෙන ලිපියේ විදිහට මට වැටුප් වර්ධක 04 ක් ලැබෙන්න ඕන. 2005.04.01 දින සිට, සහකාර සැපැයුම් කළමනාකාර තනතුරටත් මාව සම්මුඛ පරීක්ෂණයට කැඳෙව්ව දිනයේ සිට මාව ඒ තනතුරට බඳවා ගත්තා කියලා ඒ තනතුරවත් අඩුම ගාණේ මට ලැබෙන්න ඕන කියලා ඉල්ලීමක් කරනවා. 2012.07.12 දින සිට තමයි මාව සම්මුඛ පරීක්ෂණයට කැඳෙව්වේ. නමුත් මා බඳවා ගත්තේ නෑ. එදා සිට මට ඒ තනතුරේ පිහිටුවන්න කියලා අදාළ හිඟ වැටුප් ලබා දෙන්න කියලා මම ගරු අධිකරණයෙන් ඉල්ලීමක් කරන්නේ.

එසේම මෙම නඩුවේදී ඉල්ලුම්කරුගේ ස්ථාවරය වූයේ තමන්ට 2005.04.01 දින වැටුප් වර්ධක 04 ක් සඳහා හිමිකමක් තිබුණු බවත්, එකී වැටුප් වර්ධක 04 ලැබුණ ද, A1C ලිපියේ සඳහන් පරිදි 2009.03.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි තමන්ට හිමි තවත් වැටුප් වර්ධක 04 ක් තමාට ගෙවිය යුතු වුවත්, එකී වැටුප් වර්ධක හෝ ඊට අදාළ වැටුප් තමන්ට නොලැබුණු බවයි.

ඉල්ලුම්කරු වසර 14 1/2 කට වැඩි කාලයක් පමණ සේවය කළ තමාට සැපයුම් කළමනාකාර තනතුරු ලබා නොදීම සම්බන්ධයෙන් තමන්ගේ මූලික සාක්ෂියේදී මෙසේ ප්‍රකාශකොට ඇත.

ප්‍ර : තමා කියන විදිහට වැඩ බලන සැපයුම් කළමනාකරු තමන්?
උ : ඔව්.
ප්‍ර : ඊට පස්සේ ප්‍රවාහන කළමනාකරු සැපයුම් කළමනාකරු වුණා?
උ : ඔව්. ප්‍රවාහන කළමනාකරු, සැපයුම් කළමනාකරු කරලා මාව නැවතත් සැපයුම් නිලධාරී කියලා පහළට වැටුණා.
ප්‍ර : ඒ කියන්නේ වැඩ බලන එකක්නේ දීලා තිබුණේ. ඒ වැඩ බලන තනතුරට වෙනත් කෙනෙක් පත් කලාම තව කෙනෙකුට එතැන වැඩ බලන්න බෑනේ. එතකොට ආපසු හිටිය තැනට දැම්මාද? එහෙම නැත්නම් තනතුරෙන් පහත හෙලුවාද?
උ : නෑ. හිටපු තනතුරට පත් කළා. නමුත් ඒක කරන්න බැරි දෙයක් කළේ. මොකද ප්‍රවාහන කළමනාකරු සැපයුම් සම්බන්ධයෙන් කිසිම දැනුමක් නැති කෙනෙක්. එහෙම කෙනෙක් දාන්න හේතුව තමයි ස්වාමිණි වංචා, දූෂණවලට විරුද්ධව මම කටයුතු කිරීම. එතැනදී වරදක් කරන්න මම ඉඩ තිබ්බේ නෑ. මොකද ලංකා වරාය නීතිගත සංස්ථාව කියන්නේ වංචා, දූෂණවලින් පිරිච්ච ආයතනයක්. මට ඒක ලිඛිතව ඉදිරිපත් කරන්න පුළුවන්. වංචා, දූෂණ වලින් පිරිලා, ඉතිරිලා ගිය ආයතනයක්. ඒ වගේ ආයතනයක සැපයුම් කළමනාකරු විදිහට ඒගොල්ලෝ බලාපොරොත්තු වෙන්නේ කොන්ද පණ නැති එක්කෙනෙක් හැටියට. ඕනෑ දේකට ඕකේ කියන කෙනෙක් තමයි පත් කර ගන්න ඕන. ඒක නිසා තමයි ඒ අවස්ථාවේදී වංචා, දූෂණ නැතුව මම කටයුතු කරමින් හිටියේ මම ඇක්ටින් ඉද්දී, ඒක නිසා ප්‍රවාහන කළමනාකරු, සැපයුම් සම්බන්ධයෙන් කිසිම දැනීමක් නැති ප්‍රවාහන කළමනාකරු පත් කළා සැපයුම් කළමනාකරු හැටියට, මාව නැවතත් පහළට සැපයුම් නිලධාරී තනතුරට පත් කළා. ඒක නීති විරෝධී වැඩක්. මොකද සැපයුම් සම්බන්ධව කිසිම දැනීමක් නැති කෙනෙක් ඒ තනතුරට පත් කිරීම.
ප්‍ර : දැන් තමුන් වැඩ බලන සැපයුම් කළමනාකරු විදිහට පත් කරලා කොච්චර කල් ඒ වැඩ බලන තනතුර දැරුවාද?
උ : මම අවස්ථා දෙකකදී දැරුවා. එක අවස්ථාවකදී මාස 08 යි. අනික් අවස්ථාවේදී මාස 02 යි.
ප්‍ර : එතකොට අවස්ථා දෙකක් ඔය වෙනස් වෙන්නේ කොහොමද?
උ : වෙනස් වෙන්නේ ස්වාමිණි පළවෙනි අවස්ථාවේදී තමයි ලකී ප්‍රනාන්දු කියන ප්‍රවාහන කළමනාකාරතුමා, සැපයුම් කළමනාකාර විදිහට පත් කළා. ඒ වෙනකොට මම වැඩ බලන සැපයුම් කළමනාකරු ලෙස සේවය කරමින් සිටියා. සංස්ථාවේ පාලන අධිකාරියට අවශ්‍ය විදිහට වංචා, දූෂණ කරගෙන යන්න මම හිටියොත් අපහසු නිසා ඒකට ගැලපෙන පුද්ගලයෙක්ව පත්කර ගත්තා. යථා කාලයේදී ඒ අවස්ථාවලදී මූල්‍ය වංචාවන්ට අහුවෙලා රැකියාවෙන් ඉවත් කරපු අය පවා ඉන්නවා. ඒ කියන්නේ කොච්චර වංචා කරන්න ගත්තත් අහුවෙලා තියෙනවා. ඒ වගේ අවස්ථා වෙලා තියෙනවා. එහෙම අවස්ථාවල් තමයි මට මතක විදිහට මීගමුව කලපුව සම්බන්ධයෙන් මොකක්ද වංචාවක් කරලා මිලියන ගාණක ඒ අහුවෙලා ඒ හිටපු කළමනාකරුට ගෙදර යන්න වුණා. තාමත් ඒ නඩුව තියෙනවා.
ප්‍ර : දැන් තමුන් පළවෙනි වතාවේදී වැඩ බලන සැපයුම් කළමනාකරු ලෙස මාස 02 ක් ඉන්නකොට ප්‍රවාහන කළමනාකරු වන ලකී ප්‍රනාන්දු එම තනතුරට පත් කළා කියලා තමුන් කියනවා?
උ : එහෙමයි ස්වාමිණි.
ප්‍ර : ඊට පස්සේ ඔහු ඒ තනතුර කොච්චර කල් දැරුවද කියලා තමාට අවබෝධයක් තියෙනවාද?
උ : එය සෑහෙන කාලයක් දැරුවා. මට හරියටම මතක නැහැ කොච්චර කාලයක්ද කියලා.
ප්‍ර : ඊට පස්සේ තමුන් කිව්වා තමුන්ට තවත් අවස්ථාවක් ලැබුණා කියලා වැඩ බලන සැපයුම් කළමනාකරු වශයෙන් සේවය කරන්න?
උ : ඔව්. ඊට පස්සේ මට තව මාස 08 ක් විතර වැඩ බලන සැපයුම් කළමනාකරු මට සේවය කරන්න ලැබුණා. දැන් ලකී ප්‍රනාන්දු මහතා ගියාට පස්සේ නැවත මාව දැම්මා වැඩ බලන සැපයුම් කළමනාකරු හැටියට. මම මාස 08 ක් වැඩ කළා.

මෙම නඩුවේ දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදෙන ලද පරිපාලන නිලධාරිනී අයේෂා ප්‍රනාන්දු යන අය හරස් ප්‍රශ්නවලට භාජනය වෙමින් ප්‍රකාශ කරන ලද්දේ ඉල්ලුම්කරුට කුමන අවස්ථාවකදී හෝ ජ්‍යෙෂ්ඨ සැපයුම් නිලධාරී තනතුර හෝ සැපයුම් කළමනාකරු යන තනතුරු ලබා දී නැති බවත්, මානව හිමිකම් කොමිෂමේ නිර්දේශ අනුව නැවත අයදුම්පත් කැඳවලා තනතුරට සුදුස්සෙකු සොයා ගන්න කියා තමා දැනුවත් නැති බවත්, ලිපි ගොනු ආශ්‍රයෙන්වත් එවැන්නක් තමාට දැන ගැනීමට නොලැබුණු බවත්, R6 ලේඛනය අනුව ජ්‍යෙෂ්ඨ සැපයුම් නිලධාරී තනතුරේ පිහිටුවීමට නියමිතව තිබුණේ 2005.04.01 දින බවත්, එහෙත් පිහිටුවන ලද්දේ 2009.03.05 දින බවත්, එකී තනතුරු සැපයුම් නිලධාරී I ශ්‍රේණිය බවත්, A1C දරන ලේඛනය සේවකගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති බවත්, එකී ලිපියේ සඳහන් වන්නේ 2005.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් වර්ධක 04 ක් ද, 2009.03.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි තවත් වැටුප් වර්ධක 04 ක් බවද, ඒ අනුව 2005.04.01 දින සිට ක්‍රියාත්මක වූ වැටුප් වර්ධක 04 ක් ලබා දුන්නද, 2009.03.05 දින සිට ක්‍රියාත්මක විය යුතු වැටුප් වර්ධක 04 ක් ලබා දී නැති බවද ප්‍රකාශ කරන ලදී.

ප්‍ර : ඉන්ටනල් ප්‍රමෝෂන් කියලා එකකුත් තිබෙනවානේ?

උ : එසේය.

ප්‍ර : එතකොට ඉන්ටනල් ප්‍රමෝෂන් කිව්වහම මොකක්ද වෙන්නේ?

උ : ඇතුලතින් බඳවා ගැනීම.

ප්‍ර : නැත්නම් උසස් කිරීම් ලබා දීම?

උ : එසේය.

ප්‍ර : ඒ තත්ත්වය යටතේ ඉල්ලුම්කරුට ඔය තනතුර ඉල්ලීමේ හැකියාවක් තිබෙනවා නේද?

උ : එසේය.

ප්‍ර : උපාධියක් නැති වුණාට අභ්‍යන්තර උසස් කිරීම් හෝ බඳවා ගැනීම් තත්ත්වය තුළ ඉල්ලුම්කරුට සුදුසුකම් තිබෙනවා ඒ තනතුර ඉල්ලන්න?

උ : එසේය. නමුත් 2009.03.05 දින විධායක I ශ්‍රේණිය ලබා දුන්නහම ඒකේ වසර 05 ක් ගතවෙලා නැහැ. ඊළඟ ප්‍රමෝෂන් එක ඉල්ලන්න. වසර 04කින් තමයි තිබෙන්නේ.

ඒ අනුව ඉල්ලුම්කරුව A1C ලේඛනය අනුව 2009 වර්ෂයේ ගෙවිය යුතු වැටුප් වර්ධක 04 ක් ගෙවා නැති බවත්, සුදුසුකම් තිබුණද, ඉල්ලුම්කරුට සැපැයුම් කළමනාකාර තනතුර ලබාදී නොමැති බවද, එමගින් ඉල්ලුම්කරුට (පළමු පාර්ශ්වයට) බලවත් අසාධාරණයක් සිදුවී ඇති බවත් පැහැදිලි වේ. ඒ අනුව ඉල්ලුම්කරුට නොලැබුණු වැටුප් වර්ධක 04 ක් සඳහා අදාළ ගෙවීම් ද, සැපැයුම් කළමනාකාර තනතුරේ පිහිටුවා ඊට අදාළ වැටුප් ද ලබාදීමට කටයුතු කරන මෙන් පළමු පාර්ශ්වය ගෞරවනීය කාර්මික අධිකරණයෙන් අයැද සිටී. එසේම A1 වශයෙන් ලකුණු කරන ලද පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශය ද මෙම ලිඛිත දේශනවල කොටසක් සේ සළකන මෙන් අයැද සිටිමි. පළමු පාර්ශ්වයට අදාළ තනතුරු හා වැටුප් වර්ධක නොලැබීමෙන්ද, අනෙකුත් ප්‍රතිලාභ අහිමිවීමෙන්ද සිදුවූ මූල්‍යමය පාඩුව හා හිමිකම සඳහන් ලේඛනයක් මේ සමඟ ලකුණුකොට ඉදිරිපත්කොට සිටී.

මෙම නඩුවේ දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබා දෙන ලද පරිපාලන නිලධාරිනී අයේෂා ප්‍රනාන්දු යන අය හරස් ප්‍රශ්නවලට භාජනය වෙමින් ප්‍රකාශ කරන ලද්දේ ඉල්ලුම්කරුට කුමන අවස්ථාවකදී හෝ ජොෂ්ඨ සැපයුම් නිලධාරි තනතුර හෝ සැපයුම් කළමනාකරු යන තනතුරු ලබාදී නැති බවත්, මානව හිමිකම් කොමිෂන් සභා නිර්දේශ අනුව නැවත අයදුම්පත් කැඳවලා තනතුරට සුදුසුසෙකු සොයාගන්න කියා තමා දැනුවත් නැති බවත්, ලිපි ගොනු ආශ්‍රයෙන්වත් එවැන්නක් තමාට දැන ගැනීමට නොලැබුණු බවත්, R6 ලේඛනය අනුව ජොෂ්ඨ සැපයුම් නිලධාරි තනතුරේ පිහිටුවීමට නියමිතව තිබුණේ 2005.04.01 දින බවත්, එහෙත් පිහිටුවන ලද්දේ 2009.03.05 දින බවත්, එකී තනතුරු සැපයුම් නිලධාරි I ශ්‍රේණිය බවත්, A1C දරන ලේඛනය සේවකගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති බවත්, එකී ලිපියේ සඳහන් වන්නේ 2005.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් වර්ධක 04 ක් ද, 2009.03.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි තවත් වැටුප් වර්ධක 04 ක් බවද, ඒ අනුව 2005.04.01 දින සිට ක්‍රියාත්මක වූ වැටුප් වර්ධක 04 ක් ලබා දුන්නද, 2009.03.05 දින සිට ක්‍රියාත්මක විය යුතු වැටුප් වර්ධක 04 ක් ලබාදී නැති බවද ප්‍රකාශ කරන ලදී.

**පැමිණිලිකරු විසින් ඉල්ලා ඇති සහන පිළිබඳව ප්‍රතිරෝද අදහස් දක්වමින් වගඋත්තරකාර ආයතනය හෙවත් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් පහත සඳහන් කරුණු ගරු බේරුම්කරණ අධිකරණය වෙත ගොනු කොට තිබුණි.**

2. මෙම නඩුවේ පළමු පාර්ශ්වය විසින් 2014.09.22 දිනැතිව ඉල්ලුම් පත්‍රයක් ගරු කම්කරු විනිශ්චයාධිකරණය ඉදිරියේ ගොනු කරමින් එම ඉල්ලුම් පත්‍රයෙන් පළමු පාර්ශ්වය

   (1) සම්පූර්ණ හිඟ හා සියලුම ව්‍යවස්ථාපිත දීමනා වරප්‍රසාද හිමිකම් සමඟ නැවත සේවයේ ස්ථාපනය කරන ලෙසත්,

   (2) නැවත සේවයේ ස්ථාපනය නොකරන්නේ නම්, සේවය කරන ලද කාල වකවානුවට ද ඉදිරියේ දී අහිමිවන සේවා කාලයට ද සේවක අර්ථ සාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලේ දායකත්වය ද අහිමිවීමෙන් විඳීමට සිදුවන පාඩුව ද සලකා වැඩිමනත් වන්දි ප්‍රමාණයක් නියම කරන ලෙසත්, අයැද සිටින ලදී.

3. ඒ අනුව මෙම නඩුවේ පළමු පාර්ශ්වයහට රු. 1,313,280.00 වන්දි මුදලක් ද ඊට අමතරව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ දෙපාර්ශ්වය විසින් අවසන් මූලික වැටුප ලෙස රු. 41,105.00 ක මුදලක් එකඟතාවයකට පැමිණ පිළිගැනීම මත තවත් රු. 166,500/- ක මුදලක් ද ගෙවීමට දෙවන පාර්ශ්වය එකඟ වූ අතර, මේ වනවිටත් දෙවන පාර්ශ්වය විසින් එම මුදල් සියල්ල පළමු පාර්ශ්වයහට ගෙවා ඇත.

4. මෙම බේරුම්කරණ යොමුව එකී නඩු විභාගය හේතුවෙන් බහා තබා ඇති අතර එම කම්කරු විනිශ්චයාධිකරණය ඉදිරියේ ගොනු කරන ලද නඩු විභාගය උපරිමාධිකරණය දක්වා ගොස් අවසානාත්මක වශයෙන් තීන්දුව අවසන් කර ඇත. එකී SC.HC.LA.No. 55/2024 දරන 2025.02.10 දිනැති කාර්ය සටහන්හි පළමු පාර්ශ්වය විසින් තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ “The counsel for the petitioner submits that if he gets that money his client will be satisfied.” යනුවෙනි.

5. එම කාර්ය සටහන් අනුවම මෙම පළමු පාර්ශ්වය විසින් අවසානාත්මක වශයෙන් එකඟතාවයකට ද පැමිණ ඇති බවට පෙනී යයි. එම 2025.02.10 දිනැති නඩුවේ කාර්ය සටහන්හි පිටපතක් මේ වන විටත් R14 ලෙස සළකුණු කර ඇත. එසේම මෙම බේරුම්කරණ යොමුව 2018.08.28 වන දින ගොනු කරන ලද්දක් වේ.

6. පළමු පාර්ශ්වය විසින් ගරු කම්කරු විනිශ්චයාධිකරණය ඉදිරියේ 2014.09.22 දිනැතිව ගොනු කර ඇති ඉල්ලුම් පත්‍රයෙහි 05 වන වගන්තිය කෙරෙහි ගරු බේරුම්කරණයේ අවධානය විශේෂයෙන් යොමු කර සිටී.

7. එම ඉල්ලුම් පත්‍රයේ 5 වන ප්‍රකාශයේ සඳහන් කරුණු මෙසේ වේ. “මා විසින් 2011 වර්ෂයේදී ජ්‍යෙෂ්ඨ සැපයුම් නිලධාරී තත්ත්වයට මා උසස්කොට 2005.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් වර්ධක 05 ක් ලබාදෙන ලෙස වගඋත්තරකාර සංස්ථාවෙන් ඉල්ලුම් කළ ද මා වෙත වැටුප් වර්ධක 4 ක් පමණක් ලබා දෙන ලදී.”

8. මෙම ප්‍රශ්නගත කාරණාව සම්බන්ධයෙන් පළමු පාර්ශ්වය විසින් එකී 2014.09.22 දිනැති ඉල්ලුම් පත්‍රයේ ද සඳහන් කර ඇති හෙයින් එම ඉල්ලුම් පත්‍රය මූලිකකොට ගෙන පැවති එම නඩු විභාගය තුළ දී පැවති සියලු ලේඛනගත සහ වාචික සාක්ෂි සළකා බැලීමෙන් අනතුරුව **අවසානාත්මක නියෝගයක් හා සමථයකට R14 ප්‍රකාරව එළඹ ඇති බවයි.**

9. පළමු පාර්ශ්වය විසින් 02/Add/3684/2014 නඩු අංකය යටතේ ගොනු කර ඇති එම ඉල්ලුම් පත්‍රය තුළින්ම තමා 2005.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් වර්ධක 05 ක් ඉල්ලූ බවත් එයින් තමාට වැටුප් වර්ධක 04 ක් ලබා දී ඇති බවටත් පිළිගෙන ඇත.

10. කෙසේ නමුත් පළමු පාර්ශ්වය විසින් මෙම බේරුම්කරණය නොමඟ යවමින් සිය පළමු ප්‍රකාශය මගින් ඉහත කම්කරු විනිශ්චයාධිකරණයේ දී තමන්ගේ ස්ථාවරය වෙනස් කරමින් බේරුම්කරණයේ සඳහන් යොමු කිරීමෙහි විසඳිය යුතු ආරාවුල ද සූක්ෂමව වෙනස් කරමින් 2005.04.01 සිට බලාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ සැපයුම් නිලධාරී තනතුර සහ නොගෙවන ලද වැටුප් වර්ධක 04 ක් සහ ඊට අදාළ හිඟ මුදල් ද ගෙවන ලෙසට ප්‍රදානයක් අයැද ඇති බව පෙනී යයි. එහෙත් 2014.09.22 දිනැතිව ගරු කම්කරු විනිශ්චයාධිකරණය ඉදිරියේ ගොනු කරන ලද ඉල්ලුම් පත්‍රයෙහි ඉල්ලුම්කරු විසින් තමාහට නොගෙවන ලද වැටුප් වර්ධක 4 ක් හිමි බවට කිසිදු සඳහනක් කර නොමැති අතර එහිදී තමා 2005.04.01 දින සිට වැටුප් වර්ධක 5 ක් ඉල්ලූ නමුත් එයින් වැටුප් වර්ධක 4 ක් පමණක් ගෙවූ බවට ප්‍රකාශිතවම පිළිගෙන ඇත. එවැනි පසුබිමක මෙම පළමු පාර්ශ්වය සිතාමතාම ගරු බේරුම්කරණය නොමග යවමින් නව කරුණු ගෙන හැර දක්වමින් දෙවන පාර්ශ්වය විටින් විට නඩු මගට ඇද දැමීමට උත්සාහ දරන ආකාරය ඉහත ක්‍රියාවලිය තුලින්ම පැහැදිලි වේ.

11. මෙම බේරුම්කරණය තුළ ගොනු කර ඇති පළමු ප්‍රකාශය තුළ ඊට ඉදුරාම වෙනස් ස්ථාවරයක් ද ගැනීමෙන් මෙම පළමු පාර්ශ්වය චේතනාත්මකවම අයුතු ලෙස ධනවත්වීමට උත්සහ දරයි. එනම් හිතාමතාම නව කරුණක් ලෙස දැනටමත් ඉහළ උපරිමාධිකරණය දක්වා ගොස් විසඳී ආරවුලක් නැවතත් බේරුම්කරණය ඉදිරියේ නව කරුණක් ලෙස ගෙන ඒමට පළමු පාර්ශ්වය දරන උත්සාහය ව්‍යාර්ථ වේ.

**වැඩිදුර සාක්ෂි සම්පිණ්ඩනය**

12. දෙවන පාර්ශ්වය වෙනුවෙන් අයේෂා ප්‍රනාන්දු පරිපාලන නිලධාරී යන සාක්ෂිකාරිය සාක්ෂි ලබා දී ඇත. ඒ අනුව දෙවන පාර්ශ්වය වෙනුවෙන් R1 සිට R15 දක්වා ලේඛන සළකුණු කර ඇත.

13. පළමු පාර්ශ්වය විසින් කුමන ස්ථාරවයක් දැරුව ද බේරුම්කරණ යොමුවේ සඳහන් විය යුතු ආරාවුලෙහි එක් කරුණක් වනුයේ 2005.04.01 දින සිට ලබාදීමට නියමිතව තිබූ වැටුප් වර්ධක 04 ක් හා ඊට අදාළ හිඟ මුදල් ලබා නොදීම යුක්ති සහගතද යන්න වේ.

14. මෙම පළමු පාර්ශ්වය 2014.09.22 දිනැතිව ගරු කම්කරු විනිශ්චයාධිකරණය ඉදිරියේ ගොනු කරන ලද ඉල්ලුම් පත්‍රයෙහි 05 වන වගන්තිය ප්‍රකාරව පලමු පාර්ශ්වය විසින් තමා 2011 වර්ෂයේදී 2005.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් වර්ධක 5 ක් ලබා දෙන ලෙස වගඋත්තරකාර සංස්ථාවෙන් ඉල්ලුම් කළ ද තමා වෙත වැටුප් වර්ධක 4 පමණක් ලබා දෙන ලද බවට පිළිගැනීමක් සිදුකර ඇති ආකාරය ගරු බේරුම්කරණයෙහි අවධානයට යොමු කර සිටියි.

15. පළමු පාර්ශ්වය විසින් 2011.02.15 දිනැති පැති සටහනක් යොමු කරමින් 2004 මාර්තු මස සිට මා ජොෂ්ඨ සැපයුම් නිලධාරී තත්ත්වයට පත් විය යුතු නමුත් මා ඉල්ලා සිටින්නේ 2005.04.01 දින සිට වැටුප් වර්ධක 05 සමග ජොෂ්ඨ සැපයුම් නිලධාරී තනතුරේ පිහිටුවන ලෙසය යනුවෙන් ඉල්ලීමක් සිදුකර ඇත. එම පැති සටහන R15(b) ලෙස සළකුණු කර ඇත. එම ලිපිය මෙම නඩුවේ පළමු පාර්ශ්වය විසින් 2010.06.03 දාතමින් එවක සභාපති වෙත යොමු කර ඇති ලිපියක් වේ. එකී ලිපිය තුළ පළමු පාර්ශ්වය යොදා ඇති එම පැති සටහන තමාගේ නොවන බවට හෝ ස්ථාවරයක් පළමු පාර්ශ්වය ගෙන නොමැති හෙයින් එය තමා විසින් කළ ඉල්ලීම බවට හබයක් නොමැත. එම ඉල්ලීම ප්‍රකාරව මෙම පළමු පාර්ශ්වය වැටුප් වර්ධක 5 ක් පමණක් සභාපතිවරයාගෙන් ඉල්ලා ඇති බවට සාක්ෂි මගින් සනාථ වේ. එනම් මෙම පළමු පාර්ශ්වය කිසිදු අවස්ථාවක තමා හට වැටුප් වර්ධක 8 ක් ලබා දෙන ලෙසට ඉල්ලීමක් සිදුකර නොමැති අතර එසේ තමා හට වැටුප් වර්ධක 08 ක් ඉල්ලා ඉහළ කළමනාකාරිත්වයට යොමු කළ ලිපියක් හෝ නඩු විභාගයේදී පළමු පාර්ශ්වය විසින් සළකුණු කර නොමැත. ඒ අනුව තහවුරු වන්නේ මෙම නඩුවේ පළමු පාර්ශ්වය තමා විසින් වැටුප් වර්ධක 5 ක් පමණක් ඉල්ලූ බවට හොඳින්ම දන්නා කරුණක් නමුත් ගරු බේරුම්කරණය පවා නොමග යවමින් නොගෙවන ලද වැටුප් වර්ධක 4 ක් ලබා දෙන ලෙස නැවත එම ගෙවීම ලබා ගැනීමට උත්සාහ දරන බවයි.

16. පළමු පාර්ශ්වය විසින් 2011 වර්ෂයේ දී එනම් 2011.02.15 දිනැතිව කරන ලද එම ඉල්ලීම (R15(b)) අනුව එවක සිටි මානව සම්පත් කළමනාකාර, කළමනාකාර අධ්‍යක්ෂ මගින් සභාපතිට 2011.02.18 දිනැති ලිපියක් යොමු කර ඇත. එම ලිපිය R1 ලෙස සළකුණු කර ඇති එකී R1 ලිපියෙහි එවක සභාපති විසින් එම ඉල්ලීම සළකා බලා මෙම ඉල්ලුම්කරුහට වැටුප් වර්ධක 4 ක් සඳහා අනුමත කරමි, ලෙස පැති සටහනක් 2011.02.22 දිනැතිව යොමු කර ඒ බව R2 ලිපියෙන් පළමු පාර්ශ්වයට දැනුම් දී ඇත.

17. දෙවන පාර්ශ්වය වැඩිදුරටත් R1 ලිපියෙහි අන්තර්ගතය කෙරෙහි ගරු බේරුම්කරණයේ අවධානය යොමු කර සිටියි. එකී ලිපිය (R1) මගින් පළමු පාර්ශ්වය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් සිදුකර ඇති බවත්, එම පැමිණිල්ල අනුව විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු G. W. එදිරිසිංහ මහතාගේ නිර්දේශය අනුව හෝ මෙම පළමු පාර්ශ්වයහට සැපයුම් කළමනාකාර තනතුර ලබා දෙන ලෙසට නිර්දේශයක් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදුකර නොමැති බව R1 ලේඛනය අනුව තහවුරු වේ.

18. එනම් එහි නිර්දේශය වී ඇත්තේ “සැපයුම් කළමනාකරණ” තනතුර සඳහා නිසි ක්‍රමවේදය අනුගමනය කරමින් ඒ තනතුරට සුදුස්සෙකු පත් කරන ලෙසට සිදු කරන ලද නිර්දේශයක් මිස මෙම පළමු පාර්ශ්වයේ පැමිණිල්ල ප්‍රකාරව පළමු පාර්ශ්වයට එම තනතුර ලබා දෙන ලෙසට කිසිදු නිර්දේශයක් මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ලබා දී නොමැත. පළමු පාර්ශ්වය විසින් එම නිර්දේශයට විකල්පයක් වශයෙන් 2005.04.01 දින සිට වැටුප් වර්ධක 5 ක් හා “ජොෂ්ඨ සැපයුම් නිලධාරී” තනතුරෙහි පිහිටුවන ලෙසට ඉල්ලීමක් සිදු කර ඇත.

19. මෙහිදී අවධානය යොමු කළ යුතු තවත් කරුණක් වනුයේ මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශය ප්‍රකාරව “සැපයුම් කළමනාකරු” යන තනතුරට අයඳුම්පත් කැඳවා සුදුසුකම් ඇති අය අතරින් එම තනතුරට බඳවා ගත යුතු බැවින් එම තනතුර මෙම පළමු පාර්ශ්වයටම හිමි වේ යැයි පූර්ව නිගමනයක් ද සිදු කළ නොහැක.

20. එනම් එය නිසි බඳවා ගැනීමේ ක්‍රමවේදය අනුව සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව ඉදිරිපත් වී ඇති අයඳුම්කරුවන් අතුරින් වන තෝරා ගැනීමක් වන බැවින්, එම තනතුර සඳහා පළමු පාර්ශ්වයම පත් වේ යැයි නිගමනයක් කළ **නොහැකි අතර, එම තනතුරට අදාළ සුදුසුකම් පළමු පාර්ශ්වය එම අවස්ථාවේ දී සපුරා නොමැති බව R13 අනුව පෙනී යයි.** ඒ අනුව කිසිදු ආකාරයක වෙනස්කොට සැළකීමක් පළමු පාර්ශ්වයට සිදුකර නොමැත.

21. කරුණු එසේ තිබියදී පළමු පාර්ශ්වය විසින් 2011.02.15 දිනැතිව සිදුකර ඇති ඉල්ලීම සළකා බලා සභාපතිවරයා R1, 2011.02.18 දිනැති ලිපිය ප්‍රකාරව වැටුප් වර්ධක 4ක් සඳහා 2011.02.22 දිනැති පැති සටහන මගින් අනුමැතිය ලබා දී ඇත. 2011.02.22 දිනැති ලිපිය (R2) මගින් ද එවක සභාපති විසින් **2011.02.15 දිනැති ඔබගේ ඉල්ලීම සළකා බලා 2005.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් වර්ධක 04 ක් ලබාදීමට තීරණය කර ඇති බවට පළමු පාර්ශ්වයට දන්වා ඇත.** එම R2 ලිපියෙහි පිටපත්

කළමනාකාර අධ්‍යක්ෂ, ප්‍රධාන අභ්‍යන්තර විගණක, මූල්‍ය කළමනාකාර, වැඩ බලන සැපයුම් කළමනාකාර, පුද්ගලික ලිපි ගොනුවට ද යොමු කර ඇත. ඒ අනුව පළමු පාර්ශ්වයේ ඉල්ලීම අනුව **එම ගෙවීම R3 ලේඛනය ප්‍රකාරව ගණනය කර ගෙවන ලද වැටුප සහ ගෙවිය යුතු වැටුප අතර වෙනස ලෙස රු. 124,758.67 ක මුදලක් ගණනය කර එම මුදල ගෙවීම වවුචරයක් (R4) මගින් රු. 112,000/- ක මුදලක් ද ඉතිරිය 2011 මාර්තු මස වැටුපට ((R5)a සහ R5(b)) එක්කොට ලබා දී ඇත.**

22. මෙම නඩුවේ පළමු පාර්ශ්වය විසින් ද එම R4 ගෙවීම වවුචරයෙහි සිය අත්සන් (R5(a) 2011.03.08 යොදමින් එම ගෙවීම ලබාගෙන ඇති අතර එය පළමු පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්නවලදී ද පිළිගෙන ඇත. ඒ අනුව ඉහත ලේඛනගත සාක්ෂි අනුවම පෙනී යන්නේ පළමු පාර්ශ්වයහට 2011.02.22 දිනැතිව (R2) සභාපති විසින් 2005.04.01 දින සිට ගෙවීමට අනුමත කර ඇති වැටුප් වර්ධක 4 ගෙවා ඇති බවත්, එය පළමු පාර්ශ්වය ද පිළිගෙන ඇති බවයි.

23. **වැටුප් වර්ධකයන් යනු සේවකයෙකු සේවය කර උපයා ගත යුත්තක් වේ. එනම් ආයතන සංග්‍රහයේ 10.1 අනුව ද වැටුප් වර්ධකයක් අයිතිවාසිකමක් වශයෙන් සේවකයෙක්ට ලබා ගැනීමට හිමිකමක් නොමැත. සිය රාජකාරි කටයුතු ඉටු කිරීමෙන් හා වැටුප් වර්ධක කාල පරිච්ඡේදය තුළ මුළුමනින් සේවය කිරීමෙන් ඔහු වැටුප් වර්ධක උපයා ගත යුතුවේ. එසේම වැටුප් වර්ධකයක් ගෙවීමට පෙර එය උපයා ගැනීමට අවශ්‍ය කරුණු සපුරා ඇති බවට සහතිකයක් නිසි බලධාරියා විසින් අත්සන් කළ යුතු වේ. ඒ අනුව පළමු පාර්ශ්වය එසේ වැටුප් වර්ධක ඉල්ලා සිටීම පවා නිවැරදි නොවන නමුත් පළමු පාර්ශ්වයෙහි සියලු කරුණු යුක්ති සහගත සහ සානුකම්පිතව සළකා බලා එවකට සිටි සභාපති විසින් R1, R2, R3, R4 සහ R5 ප්‍රකාරව වැටුප් වර්ධක 4 ක් ගෙවීමට කටයුතු කර ඇත.**

24. එසේම තවදුරටත් මෙම නඩුවේ පළමු පාර්ශ්වය **2001.12.03 දිනැති පත්වීම් ලිපියෙන් ස්ථිර සේවයට සැපයුම් නිලධාරී ලෙස** බඳවාගෙන ඇත. පසුව සේවක දුක්ගැනවිලි කමිටුවේ නිර්දේශ යටතේ 2008.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි "සැපයුම් නිලධාරී II ශ්‍රේණියෙහි" පිහිටුවා ඇත. නැවතත් පළමු පාර්ශ්වයේ අභියාචනයක් සළකා බලා 2009.03.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි "ජ්‍යෙෂ්ඨ සැපයුම් නිලධාරී තනතුර" හෙවත් සැපයුම් නිලධාරී I ශ්‍රේණිය ලබා දීමට කටයුතු කර ඇති අතර රු. 30,175 ක වැටුප් තලයක පිහිටුවා ඇත. (R6)

25. දෙවන පාර්ශ්වය විසින් ගරු බේරුම්කරණයේ අවධානය R7 කෙරෙහි ද යොමු කර සිටියි. 2015.01.21 දිනැති R7 ලිපිය ප්‍රකාරව පළමු පාර්ශ්වයට "සැපයුම් නිලධාරී I ශ්‍රේණියෙහි" වැටුප් සංශෝධනයක් කර ඇති බවත් එනම් එහිදී 2009.03.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් සංශෝධනයක් කර ඇති බවත් එනම් එහිදී 2009.03.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ වැටුප් තලයෙහි **පිහිටුවීමට අමතරව තවත් වැටුප් වර්ධක 4 ක් එනම්, 2010, 2011, 2012 සහ 2013 වර්ෂ සඳහා ලබා දී ඇත.**

26. එහිදී 2009.03.05 දින සිට 2013.09.16 දක්වා කාල පරිච්ඡේදයට ගෙවන ලද වැටුප් සහ ගෙවිය යුතු වැටුප් අතර වෙනස ගණනය කර රු. 214,448.31 මුදලක් R9 අනුව මෙම පළමු පාර්ශ්වයට ගෙවා ඇත. එනම් එම R9 වවුචරය ප්‍රකාරව පළමු පාර්ශ්වයේ ගිණුම් අංකය වන 77007471 යන ගිණුමට ගණකාධිකාරිගේ අත්සන ද සහිතව එම මුදල් බැර කර ගෙවා ඇත. ඒ අනුව පළමු පාර්ශ්විය **ඉල්ලුම්කරුහට වැටුප් වර්ධක ගැළපීම් ඉහත අවස්ථා දෙක තුළ සිදුකර ගෙවීම් සිදුකර ඇත.** තවදුරටත් R7 ලිපිය ප්‍රකාරව පැහැදිලි වනුයේ දෙවනවර වැටුප් වර්ධක 4 ගෙවීම් සිදුකිරීම සිදුකරන අවස්ථාවේ දී මෙම පළමු පාර්ශ්වය සේවයෙන් පහ කර ඇති බවයි. ඒ අනුව සේවයෙන් පහ කර ඇති සේවකයෙක් වුවද දෙවන පාර්ශ්වය විසින් රු. 37,405 ක වැටුප් තලයක පිහිටුවා වැටුප් වර්ධක 4 ක් ලබාදීමට කටයුතු කර ඇත.

27. ඉල්ලුම්කරුගේ සිද්ධිමය සහ ලේඛනගත සාක්ෂි අනුව පැහැදිලි වනුයේ පළමු පාර්ශ්වයහට 2008.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියේ සැපයුම් නිලධාරී තනතුර ලබාදී ඇති බවත් **ඊට වසරකටත් අඩු කාලයකින් ශ්‍රේණි උසස්වීමක් වන සැපයුම් නිලධාරී I ශ්‍රේණිය තනතුර ලබා දී ඇති බවයි.** එය ද නිවැරදි නොවන නමුත් පළමු පාර්ශ්වය විසින් සිදු කරන ලද අභියාචනයක් සළකා බලා එම තනතුරෙහි පිහිටුවා ඇත. එසේම වැටුප් වර්ධක ලබා දීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගයක් පැවතිය ද මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලීම් අනුව වැටුප් වර්ධක ගෙවීම් සිදු කර ඇත.

28. පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කළ X3 සහ X4 ලිපි ප්‍රකාරව 2005.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් වර්ධක 4 ක් ද, 2009.03.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් වර්ධක 4 ක් ලබා දිය යුතු බවට සඳහන් කර ඇති අතර, ඒ අනුව **එම සියලු ගෙවීම් පළමු පාර්ශ්වයට සිදු කර ඇත.**

29. **එනම් 2005.04.01 දින සිට වැටුප් වර්ධක 4 ක් ද, 2009.03.05 දින සිට ජ්‍යෙෂ්ඨ සැපයුම් නිලධාරී තනතුරට අදාළ වැටුප් තලයෙහි පිහිටුවා ඊට අමතරව 2009.03.05 දින සිට 2013.09.16 දක්වා එනම් 2010, 2011, 2012, 2013 සඳහා වැටුප් වර්ධක 4 ක් ද ගෙවා ඇති බවට (R12) ඉහත සිද්ධිමය සහ ලේඛනගත සාක්ෂි අනුව සනාථ වේ.** ඒ අනුවම පෙනී යන්නේ ආයතනයේ අනෙකුත් සේවකයන්හට හිමි වරප්‍රසාදයන් අභිබවා මෙම පළමු පාර්ශ්වය වරප්‍රසාද ලබා ඇති බවයි. එම සියලු **අමතර වැටුප් වර්ධකයන් උපයාගත් වැටුප් වර්ධකයන් නොවන අතර සිදු කරන ලද ඉල්ලීම් ප්‍රකාරව පළමු පාර්ශ්වය ලබා ගත් ඒවා බව ලේඛනගත සාක්ෂි අනුවම පෙනී යයි.**

30. එසේම A1 ලේඛනයෙන් 2005.04.01 දින සිට නොගෙවන ලද වැටුප් වර්ධක 4 ක් ලබා දෙන ලෙසට ප්‍රදානයක් පළමු පාර්ශ්වය ඉල්ලමින් 2009.03.05 දින සිට ගෙවන ලද වැටුප් වර්ධක 4 ද 2005.04.01 දින සිට ගෙවන ලෙස ස්ථාවරයක් නඩුව විභාගයේදී ගැනීමට පළමු පාර්ශ්වය සූක්ෂමව උත්සහ දරන ලදී. එනම් 2005.04.01 දින සිට ඔහුට වැටුප් වර්ධක 08 ක් ලබා දිය යුතු බවට පළමු පාර්ශ්වයේ ස්ථාවරය වන්නේ නම් එය කිසිසේත් පිළිගත නොහැකි ස්ථාවරයකි.

31. එනම් පළමු පාර්ශ්වය ස්ථිර සේවයට බැඳී ඇත්තේ ද 2001.11.01 දින සිට වන අතර 2005.04.01 දින සිට වැටුප් වර්ධක 8 ක් ලබා දෙන ලෙසට ප්‍රදානයක් අයැදීම පවත්නා නීතිමය තත්ත්වයන්ට අනුකූල නොවන සහ යුක්ති සහගත ප්‍රදානයක් නොවන බවට ගෞරවයෙන් සැළකර සිටියි. එනම් සේවයට බැඳී වසර 4 ක් තුළ වැටුප් වර්ධක 8 ක් ගෙවන ලෙසට කර ඇති ඉල්ලීමම යුක්ති සහගත එකක් නොවේ.

32. දෙවන පාර්ශ්වය විසින් 2005.04.01 දින සිට වැටුප් වර්ධක 4 ක් ද 2009.03.05 දින සිට 2013.09.16 දක්වා වැටුප් වර්ධක 4 ක් ද ගැලපීම්කොට එනම් පළමු පාර්ශ්වය විසින් එම වැටුප් වර්ධක උපයාගත් වැටුප් වර්ධක නොවන නමුත් එම ගෙවීම් සිදුකිරීමට දෙවන පාර්ශ්වය කටයුතු කර ඇත.

33. ඒ අනුව මෙම නඩුවේ ඉල්ලුම්කරුහට කිසිදු අසාධාරණයක් සිදුව නොමැති අතර පළමු පාර්ශ්වය විසින් දෙවන පාර්ශ්වය අනවශ්‍ය ලෙසට නඩු මගට ඇද දැමීමට දරන උත්සාහයක් බවට පෙනී යයි. එසේම සැපයුම් නිලධාරී තනතුරේ (2001.11.01 දින සිට) සිට සැපයුම් නිලධාරී II ශ්‍රේණිය ද (2008.06.01 දින සිට) ජ්‍යෙෂ්ඨ සැපයුම් නිලධාරී තනතුර (2009.03.05 දින සිට) දක්වා ද උසස්වීම් ලබා දී ඇත.

34. එසේම තවදුරටත් පළමු පාර්ශ්වය විසින් ගොනු කළ LT Case No. 02/Add/3684/2014 දරන නඩුව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා පැමිණ එහිදී දෙපාර්ශ්වය විසින් ම රු. 42,105ක වැටුපකට එකඟව අදාළ වන්දි මුදල් ගණනය **කර** ගෙවා ඇති අතර එය දැනටමත් විසඳී ඇති කරුණක් වන අතර නැවත වතාවක් වැටුප් වර්ධක ඉල්ලමින් නඩු පැවරීම නීතිය මගින් වළක්වාලයි. එනම් එම නඩු කරණයන් තුළ දී පළමු පාර්ශ්වය එවකට ලබමින් සිටි වැටුප, වැටුප් තලය, වැටුප් පරිමාණ, වැටුප් වර්ධක යනාදී සියල්ල සම්බන්ධයෙන් අවසානාත්මක එකඟතාවයකට පැමිණ ඊට අනුකූල ලෙස වන්දි මුදල් ගණනය කර ගෙවීම ද Sc. Hc. LA. No. 55/2024 නඩු අංකය යටතේ සිදුකර ඇති බැවිනි.

35. In Stassen Exports Ltd. Vs Lipton Ltd. And another (2009 2SLR 172, the Supreme Court held;

> ***"Considering the views expressed on the doctrine of res judicata, it is apparent that where a final judicial decision has been pronounced by a court which had jurisdiction over the issue before it, any party to such litigation as against the other party would be estopped in any subsequent litigation from disputing such decision on the merits whether it be used as the foundation of an action or as a bar to any claim.***

36. **In *Carl Zeiss Stiftung vs. Rayner & Keeler Ltd. (No. 2) 1967 (1) AC, 853, Lord Guest stated,* "any party to such litigation as against any other party is estopped in any subsequent litigaiton from disputing or questioning such decision on the merits.**

37. **<u>පළමු පාර්ශ්වය විසින් කම්කරු විනිශ්චයාධිකරණයෙහි 2014.09.22 දිනැතිව ගොනු කළ ඉල්ලුම් පත්‍රයේ 5 වගන්තියේ 5 වගන්තියෙන් ද තමාහට වැටුප් වර්ධක 4 ක් ලබා දුන් බවට පිළිගෙන ඇත. එලෙස අවස්ථා කිහිපයකදීම පළමු පාර්ශ්වය තමාහට වැටුප් වර්ධක 4 ලබාදුන් බවට පිළිගෙන</u> ඒ අනුව ඊට පසු අවස්ථාවක එලෙස පිළිගැනීමට ප්‍රතිවිරුද්ධ ස්ථාවරයක් ගැනීම නීතිය මගින් වළක්වා සිටින බවත් දෙවන පාර්ශ්වය ප්‍රකාශ කර සිටී. එය ප්‍රතිබන්ධනය නම් සිද්ධාන්තය (Law of Estoppel) වේ.**

38. ප්‍රතිබන්ධනය (Estoppel) යන සිද්ධාන්තයට අනුව යමෙක් විසින් යම් කරුණක් පිළිබඳව කලින් කරනු ලැබූ ප්‍රකාශනයක්, පිළිගැනීමක්, හැසිරීමකින් කළ හැකි නමුත් හෝ ප්‍රතික්ෂේප කිරීමක් හේතුකොටගෙන හෝ විනිශ්චය නඩු තීන්දුවක් හේතුකොටගෙන ඊට පසු අවස්ථාවක එලෙස කළ ප්‍රකාශයට, පිළිගැනීමට, හැසිරීමකින් කළ හැඟවුමට හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ නඩු තීන්දුවට ප්‍රතිවිරුද්ධ ස්ථාවරයක් ගැනීම වළක්වා සිටී. එනම් යමෙකු කලින් නීතියෙන් එකඟ වූ දෙයට පටහැනි අයිතියක් ප්‍රකාශ කිරීම වළකමින් එමගින් ඇතිවන අසාධාරණය වැළැක්වීමේ නීතිමය මූලධර්මයකි.

In the case of Rowlands Vs. AG 74 NLR 385, it was held by Bertram C.J. that "after and exhaustive survey of English authorities having a bearing on the rule of estoppel in Ceylon law said the gist of these decisions is that it does not matter whether a person knows the truth about the facts which he by his statement or conduct misrepresents whether he knows the truth or not if he speaks or acts in such a way as to create an impression, he must take the consequences of the impression he so creates…………………"

ඒ අනුව දෙවන පාර්ශ්වය වෙනුවෙන් ගෞරවයෙන් සැළ කර සිටිනුයේ මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලීම ද යුක්ති සහගත නොවන බවයි. එනම් දෙවන පාර්ශ්වය විසින් සෑම විටම යුක්ති සහගතව කටයුතු කර ඇති බැවින් මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලීම නිෂ්ප්‍රභ කරන ලෙසට දෙවන පාර්ශ්වය වෙනුවෙන් මෙම ගරු අධිකරණයෙන් ගෞරවයෙන් අයැද සිටී.

**තීන්දු ප්‍රකාශය**

පළමු පාර්ශ්වය හෙවත් පැමිණිලිකරු වන ජී. ඩී. ජයසිංහ මහතා මෙම බේරුම්කරණ අධිකරණය තුළින් ඉල්ලා සිටින සහනය වනුයේ 2005.04.01 දින සිට ලබාදීමට නියමිතව තිබූ වැටුප් වර්ධක 4 ක් හා ඊට අදාළ හිඟ මුදල් ලබා ගැනීම හා ජ්‍යෙෂ්ඨ සැපයුම් නිලධාරී හා සැපයුම් කළමනාකරු යන තනතුරුවලට අදාළ උසස්වීම් ලබාගැනීම යුක්ති සහගත නොවන්නේ නම්, ඒ වෙනුවෙන් හිමිවිය යුතු සහනයක් ලබා ගැනීම වේ.

මෙම නඩුකරයට අදාළ තීන්දු ප්‍රකාශය ලබාදීමේදී ගරු බේරුම්කරණ අධිකරණය පහත සඳහන් කරුණු විශේෂයෙන් සැළකිල්ලට ගනු ලැබිය.

01. පැමිණිලිකරුට මේ වනවිටත් වෙනත් අධිකරණ මඟින් හිමි වී ඇති වන්දි හා සහන කවරේද?
02. මානව හිමිකම් කොමිෂන් සභා නිර්දේශ තුළින් පැමිණිලිකරුට සාධාරණයක් ඉටු වී තිබේද?
03. පැමිණිලිකරුට මෙම පැමිණිල්ලට අදාළව මේ වනවිටත් ඔහු වෙත ලැබී ඇති සහන කවරේද?
04. පැමිණිලිකරු විසින් ගරු බේරුම්කරණ අධිකරණය තුළින් ඉල්ලා ඇති සහන යුක්ති සහගත වන්නේද?

මෙම නඩුවේ පළමු පාර්ශ්වයට රු. 1,313,280/- ක වන්දියක් මෙන්ම තවත් රු. 166,500/- ක මුදලක් ගෙවා ඇති බව පැහැදිළි වේ.

පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත සිදු කළ පැමිණිල්ලට අනුව එම කොමිෂන් සභාව නිර්දේශකොට ඇත්තේ සහන සැලසීම වෙනුවට නැවත අයදුම්පත් කැඳවා අදාළ තනතුරට සුදුස්සෙකු තෝරාගත යුතු බවයි.

පළමු පාර්ශ්වය විසින් සිදුකළ ඉල්ලීම සළකා බලා වැටුප් වර්ධක 04 ක් ලබාදී ඇති අතර, ඒ අනුව ගණනය කර ගෙවන ලද වැටුප් සහන ගෙවිය යුතු වැටුප අතර, වෙනස ලෙස රු. 124,758.67 ක් වැඩිදුරටත් ගෙවා ඇත. ඒ අනුව තවදුරටත් මෙම බේරුම්කරණ අධිකරණය තුළින් ඉල්ලා ඇති සහන හිමි නොවන බවට මෙම බේරුම්කරණ අධිකරණය තීන්දු කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව සඳහන් කරමි. ව්‍යවස්ථාපිත හිමිකම් අයදුම් කිරීමට මෙම තීරණය බාධාවක් නොවිය යුතුය.

**ආචාර්ය කේ. ඒ. තිලකරත්න,**
බේරුම්කරු.

2026 ජනවාරි මස 30 වැනි දින,
බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.

EOG 04 – 0004

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.